සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක: 05 /2020

මගේ අංකය : PPSC/ES/12/FI/02/25
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා සංකීර්ණය
නව නගරය, රත්නපුර.
2020.02.12

ප්‍රධාන ලේකම් ස.ප.ස.
ආණ්ඩුකාර ලේකම් ස.ප.ස.
ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය ස.ප.ස.
සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ස.ප.
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,රත්නපුර/කෑගල්ල
වෛද්‍ය අධිකාරී, දිස්ත්‍රික් මහ රෝහල - ඇඹිලිපිටිය
වෛද්‍ය අධිකාරී, මූලික රෝහල බලංගොඩ/කහවත්ත/මාවනැල්ල/කරවනැල්ල/වරකාපොල

<u>ශ්‍රවණවේදී කාර්මික ශිල්පී තනතුර වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයට අන්තර්ග්‍රහණය කිරීම</u>

ගරු සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා විසින් ශ්‍රවණවේදී කාර්මික ශිල්පී තනතුර වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාව යටතේ ස්ථාපනය කර MT -06 වැටුප් පරිමාණය ලබා දීම සහ එම තනතුර සඳහා කථන සහ ශ්‍රවණ විද්‍යාවේදී උපාධිධාරීන් බඳවා ගැනීම යන මැයෙන් ඉදිරිපත් කරන ලද 2017.12.12 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධයෙන් 2019.04.09 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය අනුව ශ්‍රවණවේදී කාර්මික ශිල්පී තනතුර ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවෙන් ඉවත් කර වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවය යටතේ ස්ථාපනය කිරීමට අනුමැතිය ලැබී ඇති බව සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශ ලේකම්ගේ පොදු චක්‍රලේඛ අංක 01-06/2020 මගින් දන්වා ඇත.

02. ඒ අනුව 2019.04.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රවණවේදී කාර්මික ශිල්පී තනතුර වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. එමෙන්ම මෙම තනතුර සඳහා අදාළ වන නව වැටුප් කේතය වන්නේ MT – 06 වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MT – 06 වැටුප් පරිමාණය වන රු. 32,080 – 10 x 445 – 11 x 660 – 10 x 730 – 10 x 750 – 58,590 අදාළ වේ. ශ්‍රේණි ක්‍රමයන්ට අදාළ වැටුප් පියවරයන් පහත සඳහන් වන අතර වැටුප් ගෙවීමේදී එම චක්‍රලේඛ විධි විධාන අදාළ වේ.

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය |
|---|---|---|
| III ශ්‍රේණිය | ආරම්භක පියවර | රු.32,080.00 |
| II ශ්‍රේණිය | පියවර 12 | රු.37,190.00 |
| I ශ්‍රේණිය | පියවර 23 | රු.44,520.00 |
| අධි ශ්‍රේණිය | පියවර 32 | රු.51,090.00 |

03. 2019.04.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි දැනට MN – 03 – 2016 වැටුප් පරිමාණයේ III, II සහ I ශ්‍රේණි යටතේ වැටුප් ලබන ශ්‍රවණවේදී කාර්මික ශිල්පී නිලධාරීන් පිළිවෙලින් MT – 06 වැටුප් පරිමාණයේ III, II සහ I ශ්‍රේණි වලට ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වගන්තියේ විධිවිධාන වලට යටත්ව අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

04. මෙම අන්තර්ග්‍රහණය හේතුවෙන් නිලධාරීන්ගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාල නිලධාරියා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළග ඉහළ වැටුප් පියවරේ තැබීම සිදු නොකළ යුතුය.

05. එසේවුවද වුවත් ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවන්හි පැවති විධි විධාන අනුව ශ්‍රේණි උසස්වීම් ලැබූ / උසස්වීම් ලැබීමට නියමිත සුදුසුකම් සපුරා ඇති ශ්‍රවණවේදී කාර්මික ශිල්පියෙකුගේ වැටුප සමාන මුල් පත්වීම් දිනයක් සහ සමාන සේවා කාලයක් සහිතව මුල සිටම පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ සිට උසස්වීම් සඳහා අවශ්‍ය සුදුසුකම් නියමිත පරිදි සපුරා අදාළ උසස්වීම් ලද පරිපූරක වෘත්තීන්ගේ සේවයට අයත් නිලධාරියෙකුගේ වැටුප ඉක්මවීම හේතුවෙන් ඔහුට /ඇයට වන අගතිය මග හරවා ගැනීම සඳහා ශ්‍රවණවේදී කාර්මික ශිල්පී නිලධාරියෙකු වශයෙන් මුල සිටම පරිපූරක වෘත්තීන්ගේ සේවය යටතේ සිටියේ නම් ලබා ගත හැකිව තිබූ වැටුප් පියවරට එලඹෙන තුරු අන්තර්ග්‍රහණය වන වැටුප් පියවරේ රැඳී සිටීමට දැනට සේවයේ නියුතුව සිටින සියළුම ශ්‍රවණවේදී කාර්මික ශිල්පීන්ගේ එකඟතාවය ලැබී ඇත. එබැවින් ඒ අනුව වැටුප් විෂමතා නිර්මාණය නොවන ආකාරයෙන් අන්තර්ග්‍රහණ කටයුතු සිදු කර අදාල පරිදි වැටුප් ගැලපීම කළ යුතුයි.

06. අන්තර්ග්‍රහණ දිනයෙන් පසුව ශ්‍රවණවේදී කාර්මික ශිල්පී නිලධාරීන්ට අදාල වන වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ MT – 06 වැටුප් කේතයට අදාල නව බඳවා ගැනීම් හා උසස් වීම් පරිපාටිය යථා පරිදි සංශෝධනය කර මෙම කාර්යාලය වෙත ලද පසු මෙම පළාත් රාජ්‍ය සේවයට අනුමත කර අන්තර්ග්‍රහණය කිරීම් කටයුතු ඉටු කරණු ලබන බවද කාරුණිකව දන්වමි.

පී.එස්.ආර්.එම්.විජයරාජ ව/ල
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.